## පාරම්පරිකව පැවත එන අපගේ උරුමයන් පෙරටු කොටගෙන සංහිඳියාව ළගාකර ගැනීමට ග්‍රාමීය ජනතාවගේ එකමුතුවක් ගොඩනැගීම.

### හැඳින්වීම

දශක තුනක යුද්ධයෙන් පසු අද ශ්‍රී ලංකාව ඉතා සුවිශේෂි සන්ධිස්ථානයකට පැමිණ ඇත. ගැටුමට පාදක වූ මූලික හේතුවලට විසඳුම් සොයමින් ඒ තුලින් සංහිඳියාව ගොඩනගා ගන්නා අතරම මේ රටට ආවේණික වූ සතා සිවුපාවා, ගහකොළ සහ ස්වභාදහම මනාසේ ආරක්ෂා කරමින් නූතන ලෝකයේ තරගකාරිත්වය හා අප මාතෘභූමියේ භූගෝලීය හා දේශපාලනික තත්වයන් හඳුනා ගනිමින් අප වේගවත්, සමබර හා ස්ථිරසාර සංවර්ධනයකට රට ගෙන යායුතුව ඇත.

### පෙරවදන

ඕනෑම කාලයක, ඕනම සමාජ ස්ථාවරයක කාන්තාව යනු හුදෙකලා නොවූ අනූන ශක්තියකින් හෙබි තැනැත්තියකි. නූතන කාන්තාවට ඊට දේශීය හා විදේශීය ප්‍රඥප්ති, අණ පනත් මගින් මනා සුරක්ෂිතතාවක් උදෙසා අවශ්‍ය කළමණා සැකසී ඇත.

මානුෂීය ගුණයෙන් හුදෙකලා නොවී මිනිසා පරිපූර්ණ මිනිසෙකු කිරීමට උපරිම ජවය, බලය හා විනය කාන්තාව සතුය. එයට දේශීය, සර්ව ආගමික, සම්ප්‍රදායික සිතුම් පැතුම් මස්සේ පාදා ගැනීමයි.

මේ සඳහා අපි පුරවැසියන් විදිහට ඉතාමත් අගනා රටක්, හැකියාවන් සහ දක්ෂතාවලින් අපගේ ආකල්ප දියුණු කිරීමද මනුෂත්වයෙන් පිරිපුන් රටක් කිරීම අපගේ යුතුකමකි.

1. පාරම්පරිකව අපසතු පුරුදු අත්දැකීම් චාරිත්‍ර සහ අගයන තුලින් අපගේ මූලික අයිතීන් රැක ගතයුතුය.
2. සමාජ ආර්ථික සංවර්ධනය සංස්කෘතික අගයන් රැකගැනීම තුලින් ළගාකර ගැනිම
3. දේශපාලන නැඹුරු කිරීම් ක්‍රියාවලිය සමානාත්මකව සහ යුක්තිය මත පදනම් විම

අප සැමට බුක්තිවිදිය හැකි සංවර්ධිත සමාජයක් සෑදීම.

### අරමුණ

පාරම්පරිකව පැවත එන අපගේ උරුමයන් පෙරටු කොටගෙන සංහිඳියාව ළගාකර ගැනීමට ග්‍රාමීය ජනතාවගේ එකමුතුවක් ගොඩනැගීම.

### පාඨමාලාවේ අන්තර්ගතය

1. කාන්තා අයිතීන් ආරක්ෂා කිරීම. ජාත්‍යන්තර හා ජාතික අත්දැකීම් වලින් උගත් දේ
2. මානව හිමිකම් ක්‍රියාදරයින් ප්‍රජාව තුල මානව හිමිකම් සුරැකීමට කලයුතු කාර්‍යභාරය

3. පශ්චාත් යුධ සමයෙන් පසු සංහිදියාව ගොඩනැගීම මානව හිමිකම් තුලින් ප්‍රවේශයක්
4. කාන්තා අයිතීන් ආරක්‍ෂා කිරීම, මගපෙන්වීම CEDAW (ස්ත්‍රීන්ට එරෙහි සියළු ආකාර වෙනස්කම් තුරන් කිරීම පිලිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය
5. එක්සත් ජාතීන්ගේ ආරක්‍ෂක මණ්ඩලයේ යෝජනා 1325 සහ 1820 කාන්තාව, සාමය සහ ආරක්‍ෂාව

**පුහුණුකරුවන් සඳහා උපදෙස්**

කාන්තාව. සාමය. ආරක්‍ෂාව සහ සංවර්ධනය නම් වූ මෙම විෂයට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් වන සියලුදෙනා පලමුව සම්පූර්ණ අත්පොත කියවා මූලික අවබෝධයක් ලබා ගත යුතු වේ. විෂය පිලිබඳ විවිධ අත්පොත් කියවා විෂය දැනුම පුළුල් කර ගැනීම මෙම පුහුණුව වඩාත් සාර්ථක කර ගැනීමට ප්‍රයෝජනවත් වනු ඇත.

**පුහුණුවට සූදානම් වීම**

* පුහුණුව පුරා එක් දිනක් පමණක් පැවැත්වෙන අතර ඒ සඳහා සුදුසු පහසුකම් සහිත පරිසරයක් තෝරා ගත යුතු වේ. අවශ්‍ය වුවහොත් කිහිප දෙනෙකුට නේවාසික පහසුකම් වුවද ලබාදීමට හැකිනම් වඩාත් සුදුසුයි.

* පුහුණුව සඳහා අවශ්‍ය අත්පත්‍රිකා, කාලසටහනක්, පුහුණු ආධාරක, ලියන කොල, පැන් කල් තබා සූදානම් කලයුතුයි.

* වැඩසටහනට නියමිත වියදම් ඇස්තමේන්තුවක් සකස්කර ගැනීමෙන් අඩුපාඩුවකින් තොරව වැඩසටහන පවත්වාගෙන යා හැකි වේ. (ඇමුණුම අංක 01)

* පුහුණු වැඩසටහනේ සැසි අනුපිලිවෙලින් ගලා යන පරිදි පුහුණු කිරීමේ සැලැස්ම සකස් කල යුතුයි. එවිට එක් එක් සැසි වාර අතර මනා සම්බන්ධතාවක් ඇති කරගත හැකිය.

  (ආකෘතියː සැසි අනුපිලිවෙල හා අන්තර්ගතය ඇමුණුම් අංක 02)

* මාතෘකාවට අදාල දේ පමණක් සාකච්ඡා කිරීමට වග බලා ගන්න. මෙහිදී පෙර සූදානම ඉතා වැදගත් වේ. ඉවසීමෙන් ඇහුම්කන් දෙන්න.

**පුහුණු ක්‍රමවේදයන්**

පුහුණු වැඩසටහන සම්පූර්ණයෙන්ම වාගේ සහභාගිත්ව ක්‍රමවේද භාවිතා වන වැඩ සටහනක් විය යුතුය. සැසිවාරය තුල සහභාගිවන්නන් උනන්දු කිරීමේ ක්‍රියා ආදිය ක්‍රියාත්මක කල යුතුයි. සාකච්ජා, අභ්‍යාස, ඉදිරිපත්කිරීම් ආදියෙන් හැකි තරම් දුරට සහභාගිවන්නන් වැඩසටහනට දායක කර ගැනීමට පුහුණු කණ්ඩායම ක්‍රියාකල යුතුයි.

- විශ්වාසවන්තභාවය පුහුණුකරු සහ සහභාගිවන්නන් අතර තිබිය යුතුය. එමගින් එම පුද්ගලයා අවංක සිරිස්භාවයෙන් යුත්ත වීම. ( මාතෘකාව පිලිබඳව දැනුමක් නැතහොත් එය එක හෙලා නොදන්නා බව ප්‍රකාශ කිරීම සහ එය පිලිබඳව සොයා බලා පැවසීම එක් අවංක පුද්ගලයෙකු සතු දෙයකි.)
- න්‍යාය පත්‍රයක් ලගා තබා ගතයුතුය නමුත් අප මතක තබා ගතයුතුය. ප්‍රශ්න කිරීම මගින් මෙම වැඩසටහන නව පැතිකඩකට ගෙන යා හැක. අප ශ්‍රාවක ජනයාට ප්‍රශ්න කිරීමේ අයිතිය සලසා දිය යුතුය. එමගින් ශ්‍රාවකයාව ක්‍රියාශීලි කරගැනීමට හැක. (අනවශ්‍ය ලෙස ක්‍රියාකරකම් කල නොහැක.)
- සැම විටම අනපෙක්ෂිත අවස්ථාවලට සමහර සහභාගිවන්නන් අපව පත්කල හැකි බව මතකතබා ගෙන සූදානමින් සිටින්න
  - මේ වගේ තත්වයකදී අන් සහභාගිවනනන්ගේ උදව් ලබාගත හැක
  - පුහුණුකරුගේ ස්ථාවරය සහ අරමුණ මුල සිට අග දක්වා පවත්වා යා යුතුයි

- අප සංහිදියාව සහ මානව අයිතිවාසිකම් පිලිබඳව කතා බහ කරන විට අපට නුසුදුසු ප්‍රශ්නවලට මුහුණදීමට සිදුවේ.
- අප ස්ථාවරයක සිටිය යුතුය. පසුබැසීම වලක්වා ගැනීම සඳහා අවධානය ස්ථාවරයක තබා ගතයුතුය.
- එක් අවස්ථාවකදී ප්‍රේක්ෂකයෝ ප්‍රතික්ෂේප කලහැක. එවැනි අවස්ථාවකදී නිශ්ශබ්දතාවයෙන් සිටීම අවශ්‍යයි. (එය නැවැත්වීමට ඔබට හැකිය. නමුත් නැවැත්වීම ප්‍රේක්ෂකයන්ට බැණ වැදීමට නොව ඔවුන්ට හරිදේ කියාදීම, ඔවුන්ට සිතීමට ඉඩදීම)

**ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ භාවිතය**
වැඩසටහනේ ප්‍රස්ථාර හා රූප සටහන් ආදිය කල් තබා සකස් කල යුතුයි.

## 01 සැසිය

**දවසේ අරමුණ හා ප්‍රවේශය**

**වේලාව :** කාලය විනාඩි 30

**පුහුණු ක්‍රමවේදය**
පුද්ගල ක්‍රියාකාරකම්

**පුහුණු කිරීමේ මග පෙන්වීම**

- සහභාගිවන්නන් තම තමා හඳුන්වාදීම තුලින් සබකෝලය මගහරවා ගැනීම සඳහා උචිත ක්‍රියාකාරකම් කිරීම (අවශ්‍ය ද්‍රව්‍ය එම ක්‍රියාකාරකම් කිරීමට සුදානම් කලයුතුය.)
- සහභාගිවන්නා සහ දේශකයා තුල කලබලභාවයක් ඇත්නම් එය නැවැත්වීමට සහ කලබලභාවය සැහැල්ලු කිරීම මගහරවා ගැනීමට ඉඩ සලසා දීම. මෙමගින් අදහස් හුවමාරු කල හැක.

**අරමුණු**

* පාඨමාලාවට සහභාගිවීමේ අරමුණ හඳුනාගැනීම මීලගට සිදුවිය යුතුයි. කලින් සූදානම් කරගන්නා ලද Soft Card පතක් හා පෑනක් සහභාගිවන්නන්ට ලබා දෙන්න. මෙම පාඨමාලාවට සහභාගිවීමේ අරමුණ කුමක්දැයි කාඩ්පතේ සටහන් කිරීමට උපදෙස් දෙන්න. මේ සඳහා විනාඩි 05ක කාලයක් ලබා දෙන්න. අලවා ප්‍රදර්ශණය වනසේ බිත්තියේ ගසන්න.

* පාඨමාලාව අවසානයේ මෙම අරමුණ ඉටු වූවාදැයි සහභාගිවන්නන්ගෙන් විමසා බැලිය යුතු වේ.
* මීලගට පුහුණු වැඩ සටහන පිලිබඳ අරමුණු පත්‍රිකාව ප්‍රදර්ශණය කර පැහැදිලි කර දෙන්න.
* මෙම වැඩ සටහන ක්‍රියාත්මක වීමේදී අනුගමනය කරන ක්‍රමවේද හා සහභාගීත්ව පුහුණු ක්‍රම ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කර දෙන්න.

## 02 වැනි සැසිය

**කාන්තා අයිතිවාසිකම්**

**වේලාව** : පැය 1 යි විනාඩි 45
**අවශ්‍ය ද්‍රව්‍ය** : වයිට් බෝඩ්, මාක්ර් පෑන්, ෆ්ලිප් චාර්ට්, ප්ලැටික්නම්, කතුරු,, ඇමුණුම් කටු

**පුහුණු ක්‍රමවේදය** : කණ්ඩායම් අභ්‍යාස, ක්‍රියාකාරකම්, දර්ශන

**පුහුණු කිරීමට මග පෙන්වීම**
පුද්ගල ක්‍රියාකාරකමක් ඉදිරිපත් කිරීම මගින් ඔවුනට උත්තර දීමේ හැකියාව සැලැස්විය හැක. ඔවුන්ගේ පිළිතුර ඔවුනට ලබාදී ඇති කාඩ් පතේ ලියා එය පුවරුවක ගැසීම.

1. කාන්තාවක් යනු කුමක්ද?
2. කාන්තා අයිතිවාසිකම් මොනවාද?

සහභාගිවන්නන් සමග මේ සම්බන්ධව එක් වේලාවක් නියම කොට අදහස් හුවමාරු කිරීම.(වේලාව – එක් ප්‍රශ්නයකට විනාඩි 10 යි. කොළ, පෑන් ඔවුනට ලබාදීම)

- අප කාන්තා අයිතිවාසිකම් ගැන කතා බහ කරන්නේ කවුරුන් සමගද කියා අප දැන ගතයුතු සහ අප කතා කරන මාතෘකාව ගැන කෙටි හැඳින්වීමක් කල යුතුය.
- පහත සඳහන් කරුණු සහභාගිවන්නන්හට පැහැදිලි කරදිය යුතුය.
    - කාන්තා අයිතිවාසිකම් යනු කාන්තාවන්ට පුරුෂයන් සමග සමතාව ලබා ඇත්ද යන්නැයි එමගින් කාන්තාවන්ට සහ පුරුෂයන්ගේ ධාරිතාව එක සමාන ඇත්දැයි බැලීම.
    - ඇතැම් අවස්ථාවන්හිදි කාන්තා අයිතිවාසිකම් සමග කාන්තාවන්ගේ ආරක්ෂාවද ඇතුලත් වී ඇත. (ප්‍රසූත නිවාඩු) හෝ කාන්තාවන්ට හිරිහැර සිදුවන අවස්ථා (කුට්ටනය, දූෂණය)
    - කාන්තා අයිතිවාසිකම් කාලය සහ සංස්කෘතිය අනුව වෙනස් වී ඇත.
    - අදටත් කාන්තා අයිතිවාසිකම් යනු මොනවා ද පිළිබඳව විවිධ මතවාද ඇත.
    - කාන්තා අයිතිවාසිකම් මානව හිමිකමක් විය

- ජාත්‍යන්තර මට්ටමේ ඇති වැදගත් සම්මුතීන් සහ යෝජනා පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

- ස්ත්‍රීන්ට එරෙහි සියළු ආකාර වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (CEDAW)

  (සීඩෝ සම්මුතියේ පසුබිම සහ මූලික කරුණු පිළිබඳ හැඳින්වීමක් කලයුතුය.)
  අඛන්ඩව පවතින අසමානතාවය පිළිබඳ දත්ත, වෙනස් ආකාරයේ සම්මුතියක් අවශ්‍ය වීමට හේතුව සීඩෝ සම්මුතියේ ඉතිහාසය සහ එහි ව්‍යාප්තිය සිඩෝ කමිටුව, අතිරේක කෙටුම්පත් සහ සිඩෝ මූලධර්ම : සමානාත්මතාවය පිළිබඳ මූලධර්ම සමාන ලෙස සැලකීමේ මූලධර්මය, සාමාජික රටවල වගකීමේ මූලධර්මය සහ සීඩෝ වගන්ති කෙටියෙන් පැහැදිලි කලයුතුයි.

- එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා 1325

- කාන්තා අයිතිවාසිකම්වල ඇතුලත් වන්නේ මොනවාද? කරුණු සාරාංශගත කරන්න.
    - සිවිල් අයිතීන්, ආර්ථික අයිතිවාසිකම්, විවාහ දික්කසාද සහ මාපිය අයිතිවාසිකම් සහ Basic civil freedom
- කාන්තා අයිතිවාසිකම් යන ප්‍රශ්නය පිළිබඳ සාකාච්ඡා කරන්න.
- ශ්‍රී ලංකාවේ කාන්තා අයිතිවාසිකම්

- පහත සඳහන් ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මකව පවතින නීති සහ ප්‍රතිපත්ති පිළිබඳ කෙටි හැඳින්වමක් කරන්න.

✓ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
✓ සීඩෝ සම්මුතිය
✓ කාන්තා ප්‍රඥප්තිය
✓ ගෘහස්ථ හිංසනය පිටුදැකීමේ පනත
✓ Children and Young Persons Ordinance (CYPO)
✓ Child Rights Conventions (CRC)
✓ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා 1325
✓ අයාලේ යෑමේ පනත
✓ විවාහ නීතිය
✓ Pre School and Early Childhood Care and Development (ECCD) 2012
✓ දණ්ඩ නීති සංග්‍රහය
✓ Establishment Code
✓ Other Labor Legislations

මෙම නීති සහ ප්‍රතිපත්තිවල අඩුපාඩු මොනවාද ? නිසි ආකාරයෙන් ක්‍රියාත්මක විය යුත්තේ කෙසේද ? සහ අදහස් හා යෝජනා පිළිබඳව විමසීමක් නරන්න.

- සැසිය අවසානයේ වීඩියෝ දර්ශන ( මීනගේ කාටූන්) පෙන්වා ඒ හා සමගාමීව සාකච්ඡාවක් ගොඩනගා සැසියේ කරුණු සාරාංශගත කර නිමා කරන්න.

## 03 වැනි සැසිය

**මානව හිමිකම්**

**වේලාව** : පැය 1 යි විනාඩි 45යි
**අවශ්‍ය ද්‍රව්‍ය** : වයිට් බෝඩ්, මාක්ර් පෑන්, ෆ්ලිප් චාර්ට්, ප්ලැටික්නම්, කතුරු,, ඇමුණුම්

**පුහුණු කිරීමට මග පෙන්වීම**

- මානව හිමිකම් පිළිබඳ සංකල්පය සහ එහි විකාශය පැහැදිලි කිරීම.

පහත සඳහන් මානව අයිතිවාසිකම් පිළිබඳව ඇති ගිවිසුම් සහ ප්‍රකාශන ගැන පැහැදිලි කිරීම.

**ජාත්‍යන්තර මට්ටමෙන්**

- මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සහ තුන්වෙනි වගන්තිය
- සීඩෝ ප්‍රඥප්තිය
- ළමා අයිතිවාසිකම් ව්‍යවස්ථාව
- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සුරැකීම හා සම්බන්ධ සුවිශේෂී ආයතන

**ජාතික මට්ටමෙන්**

- ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති මානව හිමිකම් ප්‍රඥප්තිද පැහැදිලි කළයුතුයි. එහිදී ලංකාව ප්‍රඥප්ති කීපයකට අත්සන් තබා ඇති බැවින් ඒවා ආරක්ෂා කිරීමට ද ශ්‍රී ලංකා රජය බැඳී ඇති බව සහභාගිවන්නන් දැනුවත් කළයුතුයි.
- ජාතික මානව හිමිකම් නීති සහ ආයතන පිළිබඳව දැනුමක් ලබාදිය යුතුයි.
  - මූලික අයිතිවාසිකම් සහ මානව හිමිකම් අතර වෙනස පැහැදිලි කළයුතුයි.
  - මූලික අයිතිවාසිකම් කඩ වූ අවස්ථාවල සහන ලබාගන්නේ කෙසේද, මූලික අයිතිවාසිකම් සම්බන්ධව සීමාවන් මොනවා ද යන්න ජනතාව දැනුවත් කිරීම.

**එකිනෙකට වෙනස් කතාන්තර සහ මානව හිමිකම් තුළින් ප්‍රවේශයක් ලබාගැනීම.**

පශ්චාත් යුධ සමය ගැන කතා කරන විට ශ්‍රී ලංකාව සාමාන්‍ය තත්වයට පත්ව නැති බවත් යුද්ධයට මූලික වූ කරුණු වටහාගෙන නැති බවත් සහභාගිකයන් ඒත්තු ගැන්විය යුතුයි. තවමත් අප සැඟවී ඇති යුද්ධයකට මුහුණදෙමින් පවතී. එනම් පශ්චාත් යුධ සමයේද ගැටුමක් පවතී




- විවිධ කතාන්තර පවතී නම් ගැටුම්කාරී තත්වයන්ද පැවතිය හැක. (අවි නිශ්ශබ්ද වුවද)
- එක් කතාන්තරයක් යටපත් වුවද අනෙක් කතාන්තරය ජනතාව අතර තවමත් තිබේ
- සංහිඳියාව – එකිනෙකට වෙනස් කතාන්තර 2 ක් පිළිගත් එක් කතාන්තරයකට ගෙන ඒම




- මානව හිමිකම් ප්‍රවේශය භාවිතා කිරීමේදී පහත සඳහන් කරුණු මතක තබා ගතයුතුයි.
  - ✓ ඇතැම් අවස්ථාවල එක් කතන්තරයක් නිර්මාණය කිරීමට හැකියාවක් නැතිවිය හැක. නමුත් අප ඇහුන්කම් දී සංහිඳියාව ගොඩනැගීමට ක්‍රියාකල යුතුයි.
  - ✓ අප ක්‍රියාවලියක් අනුගමනය කලයුතුයි. ක්‍රියාවලිය අතරතුර සහභාවන්නන් තේරුම් ගැනීමට ඉඩකඩ ඇත.
  - ✓ මැදිහත්වීම වැදගත් නමුත් ශ්‍රී ලංකාවේ මෙය සීමිතයි
  - ✓ නොපෙනෙන අයිතිවාසිකම්ද මතුවිය හැක.

- ගැටුමකදී එක් පැත්තක් පමණක් ජනතාවට දැක ගත හැක. සංස්කරණය කල කොටසක් මාධ්‍යට නිකුත් වේ. දර්ශන දැකීමෙන් පසු ක්ෂණික තීරණවලට එළඹේ. මෙහිදී එම දර්ශන පිළිබඳ අදහස් දැක්වීමේදී පක්ෂපාතිත්වයක් දැක ගතහැක.

**ක්‍රියාකාරකම**

වාරියපොල සිදුවීම (ගැහැණු ළමයෙක් මිනිසුන් තලේදී පිරිමි ළමයෙකුට පහරදීම) හෝ වෙනත් ඕනෑම ගැටුම්කාරී සිදුවීමක් උදාහරණයක් ලෙස ගෙන

- ✓ එම පාර්ශව සංහිඳියාව කරා ගෙනයෑමට හැකිවේද/ගෙය යා යුතුද?
- ✓ අපේක්ෂිත ප්‍රතිපල මොනවාද ?
- ✓ ගනුදෙනු කලහැකි කාරණා මොනවාද?

සහභාගිවන්නන් කණ්ඩායම් තුන හතරකට බෙදා මිනිත්තු 30 ක් සාකච්ජා කිරීමට සහ ඉදිරිපත් කිරීමට වෙන් කරන්න.

## <u>05 වන සැසිය</u>

**කාන්තාව, සාමය, ආරක්ෂාව පිළිබඳව වූ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1325 යෝජනාවලිය**

**කාලය** - පැය 01යි විනාඩි 45 යි

**පුහුණු ආධාරක** - ෆ්ලිප් චාට්, Zoop card, වයිට් බෝඩ්, වයිට් බෝඩ් මාකර්ස්, අත් පත්‍රිකා

**පුහුණු ක්‍රමවේදය**

සාකච්ඡා/දේශන/කණ්ඩායම් අභ්‍යාස

**පුහුණු කිරීමේ මඟ පෙන්වීම**

- එක්සත් ජාතීන්ගේ සංවිධානය, ආරක්ෂක මණ්ඩලය, එහි අරමුණු පරමාර්ථ හා සේවය පිළිබඳ කලින් කරන ලද හැඳින්වීම් මතක් කර දෙන්න

- මෙය බටහිර රටවල ආකල්පයක් නොව ආසියාතු රටවලින් මේ පිලිබඳ මූල් අදහස ඉදිරිපත් වී ඇති ආකාරය පැහැදිලි කරන්න. ජාත්‍යන්තරයෙන් උදාහරණ ගෙන දක්වන්න. අවි ගැටුම් පවතිනවිට ලොව සැම තැනකම විශේෂයෙන්ම කාන්තාවන්ගේ ආරක්ෂාව පිලිබඳ දැඩි ප්‍රශ්න මතු වී ඇති අතරම සමහර රටවල කාන්තාවන් දැඩි වද හිංසනයට පත්කිරීම යුධ අවියක් කොටගෙන ඇතිබව සඳහන් කලහැක.

- මේ නිසාම කාන්තාවන්ගේ ආරක්ෂාව ස්ථාපිත කිරීමටත් ගැටුම් නිරාකරණෙහිලා ඔවුන්ගේ සුවිශේෂී හැකියාවන් උපයෝගි කරගත් ආකාරය ජත්‍යන්තර උදාහරන ගෙනහැර පාමින් දක්වනන.

- ජාතික වශයෙන් ශ්‍රී ලංකාවේ සාම ක්‍රියාවලිය තුල කාන්තාවන් ගෙන් ලැබුණ සුවිශේෂී දායකත්වය සඳහන් කරන්න. උදාහරණ කාන්තා උප කමිටුව (Gender subcommittee)

- 1325 යෝජනාවලියේ ප්‍රධාන කුළුණු 04 කි.
  1. සාම ක්‍රියාදාමයන්හි හා අනිතුත් අවස්ථාවල විශේෂයෙන්ම තීරණ ගන්නා මට්ටම්වල කාන්තා සහභාගීත්වය
  2. සාම සාදනය හා පුහුණු කිරීමේදී කාන්තා අවශ්‍යතාවයන්ට සංවේදී වීම
  3. කාන්තාවන්ගේ ආරක්ෂාව ස්ථාපිත කිරීම
  4. එක්සත් ජාතීන්ගේ වාර්ථාකරණයේදී කාන්තා කණ්ඩායම්වල අදහස් ලබාගැනීම.

මේවායේ අරමුණු හා පරමාර්ථ විශේෂයෙන් මතු කරමින් සාකච්ඡා කරන්න

මීළඟට සහභාගීවන්නන් කණ්ඩායම් 04 කට බෙදන්න

1. සහභාගිත්වය
2. වැළැක්වීම
3. ආරක්ෂාව
4. නැවත ගොඩනැගීම හා ප්‍රතිසන්ධානය

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා 1325 ප්‍රායෝගිකව ශ්‍රී ලංකා සමාජය තුල කොතරම් ක්‍රියාත්මක වන්නේදැයි සටහන් කිරීමට කණ්ඩායම් 04 කට වෙන වෙනම මාතෘකා වශයෙන් පවරන්න.

- කාලය විනාඩි 15 ක් ලබා දෙන්න
- ඉදිරිපත් කිරීමට කණ්ඩායමට විනාඩි 03 බැගින් ලබා දෙන්න
- 02 වන සැසියේදී එම මාතෘකා 04 ලබාදුන් පිළිතුරු සහ මෙම සැසිය තුළදී ඉදිරිපත් කරන කරුණු සන්සන්දනාත්මකව සරල විග්‍රහයක යෙදෙන්න
- මෙම සැසියේ පහත කරුණු සාකච්ජා කළ යුතු වේ
    - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (4) සමඟ 1325 ගැලපීම
    - ශ්‍රී ලංකාව තුල 1325 යෝජනාවලිය නීතියක් බවට පත් කිරීම කළ යුත්තේ කෙසේද?
    - අදාල ප්‍රදේශය අනුව පශ්චාත් යුධ තත්වය පිළිබඳව 1325 යෝජනාවලිය ගැලපීම.
    - 1325 යෝජනාවලියේ ප්‍රතිලාභ හිමිවනතේ ප්‍රජාවට බව දක්වමින් ඒ සඳහා ඔවුන් දිරිමත් වීමේ අවශ්‍යතාවය පෙන්වා දීම
- සහභාගීවන්නන්ගේ ප්‍රශ්න ගැටළු සාකච්ජා කර ඔබගේ අරමුණට අනුව සමස්ථ සැසිය සාරාංශ ගත කරන්න. මෙහිදී
  “පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා සර්වාභරණයෙන් සැරසුණු කාන්තාවකට ගමන් කිරීම”යන කියමන 1325 ඇති කාන්තාව, සාමය හා ආරක්ෂාව යන්නට ගලපා එවැනි සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් කරා ගෙනයෑමට දරන්නාවූ ප්‍රයත්නයක් බව සඳහන් කරන්න.

මේ සියල්ල 1325 යෝජනාවලියේ අන්තර්ගත හා බැදී පවතින බව පාඨමාලාලාභීන් විසින් තේරුම් ගත යුතුය.

**අත්වැල ඇගයීම හා නිමාව**

**<u>දෛනික වැඩ සැලැස්මේ ආකෘතිය</u>**

- 9.00 a.m – ආරම්භය සහ පිලිගැනීම
- 9.00 - 9.30 a.m - පළමු සැසිය
- අරමුණු පැහැදිලි කිරීම සහ හඳුනා ගැනීම
- 9.30 - 11.15 - දෙවන සැසිය කාන්තා අයිතිවාසිකම්
- 11.15 - 11.30 – තේ විවේකය
- 11.30 a.m- 01.15 p.m – තුන්වන සැසිය මානව හිමිකම්
- 1.15 p.m - 1.45 දිවා ආහාරය
- 1.45 p.m - 3.30 p.m – හතරවන සැසිය එක්සත් ජාතීන්ගේ යෝජනා 1325 යෝජනාවලිය
- 3.30 p.m to 04.00 p.m – ඇගයීම තේ සහ නිමාව